Class	370.72
No	S39

නොවිධිමත් අධ්‍යාපනය යටතේ වන මූලික සාක්ෂරතා වැඩසටහන්හි ක්‍රියාකාරීත්වය

එච්. එල්.ටී. ශ්‍යාමලී

අධ්‍යාපනවේදී උපාධිය (දෙවන පෙළ ඉහළ)

කොළඹ විශ්වවිද්‍යාලය

QUSL Library
Dept. of
Secondary &
Tertiary Edu.

ද්විතියික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය

අධ්‍යාපන පීඨය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය,

නාවල - නුගේගොඩ

2019

සංක්ෂිප්තය

නොවිධිමත් අධ්‍යාපනය යටතේ වන මූලික සාක්ෂරතා වැඩසටහන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳව සොයා බැලීම මෙම පර්යේෂණය ඔස්සේ සිදු කෙරිණි. සමීක්ෂණ පර්යේෂණ පිරිසැලසුමට අනුව පර්යේෂණය සිදු කෙරිණි. දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සාක්ෂරතා වැඩසටහන්හි ස්වභාවය විමසා බැලීම, සාක්ෂරතා වැඩසටහනක් සඳහා යොදා ගන්නා මානව හා භෞතික සම්පත් හඳුනා ගැනීම, සාක්ෂරතා වැඩසටහන්හි යොදා ගැනෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයන් සොයා බැලීම, සාක්ෂරතා වැඩසටහන්වල ක්‍රියාකාරිත්වය පිළිබඳ ගුරු - සිසු සාංජානන විමසා බැලීම, සාක්ෂරතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පැන නැඟී ඇති ගැටලු හඳුනා ගැනීම හා එම ගැටලු අවම කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම යන ප්‍රධාන අරමුණු හයක් ඔස්සේ අධ්‍යයනය මෙහෙයවනු ලැබීය. නියැදිය සඳහා මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය අධ්‍යාපන කලාපයේ ක්‍රියාත්මක වන මූලික සාක්ෂරතා පන්ති අතරින් පහක් සරල අහඹු නියැදි ක්‍රමයෙන් තෝරා ගැනිණි. එසේම පන්ති පහේ ඉගෙනුම ලබන සිසුන් අතරින් සිසුන් හැට දෙනෙකු අහඹු නියැදිකරණයෙන් තෝරා ගත් අතර පන්ති පහේ උගන්වනු ලබන සාක්ෂර පාඨමාලා උපදේශිකාවන් පස්දෙනා සාක්ෂර පාඨමාලා උපදේශිකා නියැදිය ලෙස තෝරා ගනු ලැබිණ. මීට අමතරව ව්‍යාපෘති නිලධාරීන් හය දෙනෙකු අහඹු නියැදිකරණයෙන් තෝරා ගත් අතර ඒ අනුව සම්පූර්ණ නියැදිය හැත්තෑඑක් දෙනෙකුගෙන් යුක්ත විය. ප්‍රශ්නාවලී භාවිතයෙන් සිසුන්ගෙන් හා සාක්ෂර පාඨමාලා උපදේශිකාවන්ගෙන් දත්ත රැස් කළ අතර සිසු නියැදිය සාක්ෂරතාවයෙන් දුර්වල අය නිසා එම ප්‍රශ්න සිසුන් වෙත ඉදිරිපත් කිරීමෙන් ඔවුන් ලබාදුන් තොරතුරු සටහන් කර ගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා භාවිතයෙන් ව්‍යාපෘති නිලධාරීන්ගෙන් දත්ත රැස් කරන ලදී. මීට අමතරව නිරීක්ෂණ නියමාවලියක් භාවිතයෙන් සාක්ෂර පන්ති නිරීක්ෂණයට ලක්කොට දත්ත සටහන් කර ගන්නා ලදී. ලබාගත් දත්ත ගුණාත්මකව මෙන්ම ප්‍රතිශත, වගු, ප්‍රස්තාර ඇසුරින් ප්‍රමාණාත්මකව අරමුණුවලට අදාලව විශ්ලේෂණය කර ඉදිරිපත් කරන ලදී. දත්ත විශ්ලේෂණයෙන් ලබාගත් ප්‍රතිඵල අනුව පහත සඳහන් නිගමනයන්ට එළඹිණි. එනම්, එකම අරමුණක් හා ක්‍රමවේදයක් ඔස්සේ දිවයින පුරාම නොවිධිමත් අධ්‍යාපනය යටතේ සාක්ෂරතා වැඩසටහන් ක්‍රියාත්මක වන බව,විධිමත් අධ්‍යාපනයෙන් ගිලිහී සාක්ෂර හැකියාව ලැබීමට යොමුවන ශිෂ්‍ය පිරිසෙන් බහුතරය වයස අවු. 10-14 කාණ්ඩයේ පිරිමි ළමුන් බව, සාක්ෂරතා පන්ති පැවැත්වෙන දිනයන් හා වේලාවන් හි විවිධතාවක් දක්නට ලැබෙන බව,සාක්ෂරතා පන්තිවල භෞතික සම්පත් නිඟ බව, ක්‍රීඩා ක්‍රමය - කතාන්දර ක්‍රමය හා කණ්ඩායම් ක්‍රමය වඩා සාර්ථක ඉගැන්වීම් ක්‍රම වී ඇති බව,සාක්ෂරතා වැඩසටහන ඵලදායී වැඩසටහනක් ලෙස සිසුන් මෙන්ම උපදේශිකාවන් සංජානනය කෙරෙන බව, සාක්ෂරතා වැඩසටහන සම්බන්ධයෙන් සිසුන් වැඩි වශයෙන් මුහුණු දෙනු ලබන්නේ සම්පත් ආශ්‍රිත ගැටලු හා පන්තිය පිහිටි ස්ථානය ආශ්‍රිත ගැටලුවලට බව යන නිගමන වේ. අවසාන වශයෙන්, පාසල් යා යුතු වයසේ පාසල් නොයන ළමුන් පිළිබඳ දීප ව්‍යාප්ත පුළුල් සමීක්ෂණයක් සිදු කිරීම, අසමත්වන්නන් හා ඇද හැලෙන්නන් අනුපාතය අවම කර ගැනීම සඳහා විධිමත් අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කළ

යුතු බව, සාක්ෂරතා පන්ති පිළිබඳව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය ලබාදිය යුතු බව, සාක්ෂරතා වැඩසටහන් පිළිබඳව අධීක්ෂණය හා නියාමනය විධිමත් කළ යුතු බව, සාක්ෂරතා වැඩසටහන් සඳහා රාජ්‍ය නොවන සංවිධානවල අනුග්‍රහය ලබාගත යුතු බව, සාක්ෂර පාඨමාලා උපදේශකවරුන්ට නිසි පුහුණුවක් හා දීමනා ලබා දිය යුතු බවට යෝජනා ඉදිරිපත් කර ඇත.

Abstract

This research investigated the effectiveness of basic literacy programs under non-formal education. The research was carried out according to the survey research design. Identify the nature of current literacy programs, identify human and physical resources used in forum programs, find out the learning and teaching methods used in literacy programs, Teacher – Student – perception on the functioning of the literacy program, Exploring the issues in the implementation of literacy programs and make proposals to minimize those problems are forthcoming. The study was conducted with six main objectives. For the sample a simple random sample of five elementary literacy classes operating in the Deniyaya educational zone in Matara district was selected. Also sixty students were randomly selected among the students in the class, then the five literacy instructors who later teach the five classes were selected as the literacy instructors. In addition six project officers were randomly sampled and the total sample was seventy. Data were collected from students and literacy instructors using questionnaires. Because the student sample was poor in literacy, the questionnaire was given the researcher by presenting the questions to the students. Data were collected from project officers using interviews. In addition, the literacy classes were observed and recorded using a monitoring protocol. The result obtained were qualitatively analyzed and presented in terms of the quantitatively by percentage and graphs. Based on the result of the data analysis, the following conclusions are drawn. Literacy programs are being conducted in the country under non-formal education with the same objective and methodology. The majority of the students who are stripped of formal education and attain to get literacy are boys in the age group of ten to fourteen. The dates and times of literacy classes vary greatly, lack of physical resources in literacy classes, the game system, story telling and teamwork have been the most effective teaching methods, students and literacy instructors perceive literacy programs as an effective program, students face the most resource – related problems and class-related problems in the literacy program are the conclusions. Finally, conducting an island wide survey on non-school going children, those who are fail and drop are drawn to the idea that formal education must be reformed to reduce the rate, literacy classes should be promoted through electronic and print media, that the monitoring and regulation of

literacy programs be regulated, NGO's support for literacy programs, literacy instructors should be properly trained and paid are the suggestions.